## ටවර් හෝල් රඟහල පදනම - 2012

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ටවර් හෝල් රඟහල පදනමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිලිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(ආ) යන්ත්‍ර, පිරියත හා උපකරණ අයිතම 09 ක පිරිවැය එකතුව සහ ධාවනයේ පවතින වාහන 06 ක මුළු පිරිවැය පිළිවෙලින් රු.146,882,915 ක් හා රු.12,103,015 ක් වූ අතර ශේෂ පත්‍ර දිනට ඒවායේ වර්තමාන මුළු ශුද්ධ වටිනාකම පිළිවෙලින් රු.19,879,124 ක් හා 2,114,675 දක්වා අඩුවී තිබුණි. එම වත්කම්වල සාධාරණ අගය දැක්වෙන පරිදි ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) "කලාපුර" හා "ටී.කේ.ශබ්දාගාරය" පිරිවැය පිළිවෙලින් රු.15,135 ක් හා රු.104,044 ක් වූ වත්කම් 2005 හා 2011 වර්ෂවලදී පදනමෙන් ඉවත්කර තිබුණත් එම වත්කම් ශුන්‍ය අගයන් සහිතව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 1.2.2 ලැබිය යුතු ගිණුම්

වර්ෂ 5 කට වඩා පැරණි හිඟහිටි ණයගැති ශේෂ 4 ක මුළු වටිනාකම වූ රු.120,620 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

### 1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දැක්වෙන ගිණුම් විෂයයන් සම්බන්ධයෙන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොමැතිවීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

| ගිණුම් විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| කාර්යාල උපකරණ, පරිගණක, යන්ත්‍ර හා පිරියත, සංගීත උපකරණ | 137,951,196 | ස්ථාවර වත්කම් ලේඛනය, ප්‍රධාන ඉන්වෙන්ට්‍රි ලේඛනය හා භාණ්ඩ සමීක්ෂණ වාර්තා |

### 1.2.4 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම

නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනත 11 වන වගන්තිය සහ 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 ඡේදය | රාජ්‍ය ව්‍යවසායවල අතිරික්ත මුදල් ආයෝජනය කිරීමේදී භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතු වුවත්, පදනම විසින් 2012 වර්ෂයේදී සිදුකළ රු. මිලියන 3 ක ස්ථාවර තැන්පතු ආයෝජනය සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ආ) | මුදල් රෙගුලාසි 756, 757 සහ 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.5 ඡේදය | සෑම වර්ෂයකම දෙසැම්බර් 15 දින හෝ එම දිනට ආසන්නව සමීක්ෂණ මණ්ඩලය පත්කර භාණ්ඩ සමීක්ෂණයක් සිදු කළයුතු වුවත්, පදනම විසින් 2012 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය 2013 ජුනි මාසය වන විටත් සිදු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | මුදල් රෙගුලාසි 454 (1) සහ 751 (1) | එල්ෆින්ස්ටන් රඟහල නවීකරණයේදී මිලදී ගෙන තිබූ රු.9,641,290 ක් වටිනා යන්ත්‍ර හා උපකරණ ප්‍රධාන ඉන්වෙන්ට්‍රි ලේඛනයේ ඇතුළත් කර එම ලේඛනය මඟින් එක් එක් අංශවලට ඉන්වෙන්ට්‍රි භාණ්ඩ බෙදා හැර නොතිබුණි. |
| (ඈ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.5 (ඒ) ඡේදය සහ 2006 ඔක්තෝබර් 09 දිනැති අංක පීඊඩී/39 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 02 ඡේදය | පදනම විසින් සහකාර අධ්‍යක්ෂ (නාට්‍ය ප්‍රවර්ධන කලාකරු සුභසාධන හා වැඩ සටහන් ) ටද, 2012 සැප්තැම්බර් දක්වා ජ්‍යෙෂ්ඨ කලමනාකරු (රඟහල්)ටද පදනමේ වාහන ලබාදී මාසික ඉන්ධන දීමනාව වශයෙන් රු.17,880 බැගින් 2012 වර්ෂය සඳහා පිළිවෙලින් රු.211,680 ක් හා රු.158,040 ක් භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමකින් තොරව ගෙවා තිබුණි. |
| (ඉ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 සහ 8.9.3 මාර්ගෝපදේශ | රු.මිලියන 289 ක ඇස්තමේන්තුගත වටිනාකමක් සහිත එල්ෆින්ස්ටන් රඟහල නවීකරණ ව්‍යාපෘතියේ උපදේශක සේවා සැපයීම ජාතික ගොඩනැගිලි දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබන අතර ශ්‍රම දායකත්වය සැපයීම මගින් ඉදිකිරීම් කටයුතු කරගෙන යාම සිවිල් ආරක්ෂක කටයුතු දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබයි. 2012 මැයි 31 දින ඉදිකිරීම් ආරම්භ කර තිබුණත් ටවර්හෝල් රඟහල පදනම විසින් 2013 අප්‍රේල් වන විටත් මෙම පාර්ශවයන් සමග කිසිඳු එකඟතා ගිවිසුමකට එළඹ නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ ටවර්හෝල් රඟහල පදනමේ මූල්‍ය ප්‍රතිඵලය රු.11,411,238 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂය් ඌනතාවය රු.11,657,128 ක් විය. ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයේ රු.245,890 ක වර්ධනය සඳහා, පදනමේ මෙහෙයුම් වියදමට සාපේක්ෂව මෙහෙයුම් ආදායම වැඩිවී තිබීම හේතුවී තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පෙර වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුළදී බැංකු තැන්පතු පොලී හා කුලී ගාස්තු ආදායම රු.3,933,631 කින් හෙවත් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 19.67 කින් වැඩිවී තිබුණ ද පදනමේ ප්‍රධාන මෙහෙයුම් ආදායම වූ ශාලා කුලී ආදායම් රු.3,434,935 කින් හෙවත් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 33 කින් අඩුවී තිබුණි. එමෙන්ම ආයතන හා පරිපාලන වියදම් රු.4,268,940 කින් හෙවත් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 7.88 කින් වැඩිවී තිබුණි. ශාලා කුලී ආදායම වැඩි ප්‍රතිශතයකින් අඩු වුවද ආදායමට සාපේක්ෂව වියදම් අඩුවීම හේතුවෙන් ඌනතාවයේ සුළු ප්‍රමාණයක අඩුවීමක් සිදුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ක්‍රියාකාරී සැලැස්මට අනුව එල්ෆින්ස්ටන් රඟහලේ නවීකරණ කටයුතු 2012 මුල් කාර්තුව තුළ ආරම්භ කර 2012 වර්ෂය අවසානය වන විට රු. මිලියන 80 ක වැඩ කටයුතු අවසන් කිරීමට සැලසුම් කර තිබුණද, 2012 වර්ෂය අවසන් වන විට මෙම කටයුතුවල මූල්‍ය ප්‍රගතිය රු. මිලියන 14.99 ක් පමණක් වූ අතර භෞතික කාර්ය සාධනය ද ඒ වන විට මැනිය හැකි තත්ත්වයක ප්‍රමාණවත්ව සිදු කර නොතිබුණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

2009 වර්ෂයේදී ටවර් රඟහල නවීකරණයෙන් පසු එහි අලුතින් ආසන 735 ක් සවිකිරීම සඳහා රු.9,195,975 ක් ගෙවා තිබුණි. ආසනයක උපරිම උස මි.මීටර් 850 ක් ලෙස තාක්ෂණික ඇගයුම් කමිටුව විසින් ලබාදී තිබූ පිරිවිතරයන් නුසුදුසු බවට නිරීක්ෂණය කර පසුව මි.මීටර් 1000 ක් ලෙස වෙනස් කර මිලදී ගැනීම් සිදු කිරීම හේතුවෙන් පසු පස ආසනවල ප්‍රේක්ෂකයන්ට නිසි අයුරින් වේදිකාව දර්ශනය නොවීමේ ගැටලුව පැන නැගී තිබුණි. ටවර් රඟහල නවීකරණය කර

වර්ෂ 2 කට අධික කාලයක් ගත වුවත් 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිලිසකර කර නොතිබුණි.

අඩුපාඩු සහිතව සවි කළ ආසන ගලවා පසු පස ආසනවලට වේදිකාව දර්ශනය වන ලෙස නැවත සකස් කිරීමේ පිරිවැය දැරීමට සිදුවීමත්, එම කාලය තුළ රඟහල වසා දැමීමෙන් ආදායම අහිමිවීමේ අවදානම දැරීමට සිදුවී තිබුණි.

4. <u>ගිණුම්කටයුතුභාවය හා යහපාලනය</u>

4.1 <u>ගිණුම් ඉදිරිපත් කිරීම</u>

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 6.5 ඡේදය ප්‍රකාරව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 පෙබරවාරි 28 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද, මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කරන ලද්දේ මාස 5 ක ප්‍රමාදයකින් පසුව 2013 ජූලි 17 දින දීය.

(ආ) 2013 අප්‍රේල් 08 දින විගණනයට ඉදිරිපත් කරන ලද කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන විගණනයේදී හෙලිදරව් වූ රු.18,315,952 ට අදාල ගිණුම්කරණ අඩුපාඩුද රු.13,594,425 කට අදාල පැහැදිලි නොකළ වෙනස්කම් ද පෙන්වා දීමෙන් පසු අවසන් මූල්‍ය ප්‍රකාශන නිවැරදි කර විගණනයට ඉදිරිපත් කරන ලදී.

(ඇ) ලෙජරයේ ඇති එක් එක් ගිණුම් හඳුනා ගැනීම සඳහා සංකේත අංක ක්‍රමයක් භාවිතා කර නොතිබූ අතර, ලෙජරයේ ඇති ගිණුම් වර්ගීකරණය කර සාරාංශ කර ශේෂ පිරික්සුම සකස් කර නොතිබුණි. එකම ස්වරූපයේ ගනුදෙනු සඳහා ආයතනය හා වර්ෂය පදනම් කර ගනිමින් ගිණුම් රාශියක් පවත්වා තිබුණි.

4.2 <u>සංයුක්ත සැලැස්ම</u>

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 ඡේදය ප්‍රකාරව පදනමේ මෙහෙවර ඉටුකර ගැනීම සඳහා එහි අරමුණු හා ඉලක්ක කරා ලඟාවිය හැකි පරිදි වර්ෂ 3 කට නොඅඩු කාලපරිච්ඡේදයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

4.3 <u>ක්‍රියාකාරී සැලැස්ම</u>

පදනම විසින් ඉහත 5.2 ඡේදයේ සඳහන් පරිදි සංයුක්ත සැලැස්මක් පිළියෙල නොකර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණි.

4.4 **අයවැය ලේඛනමය පාලනය**

2012 වර්ෂය සඳහා සකස් කර තිබූ සංශෝධිත අයවැය ලේඛනයේ සඳහන් ඇතැම් ආදායම් හා වියදම් ඉලක්කයන් තථ්‍ය වශයෙන් ළඟාකර ගැනීමේදී සියයට 21 ක සිට සියයට 8100 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය සඵල මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

4.5 **වාර්ෂික වාර්තා සභාගත කිරීම**

පදනම විසින් 2011 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2013 මාර්තු 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

5. **පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා පදනමේ අධ්‍යක්ෂ ජනරාල් වෙත වරින් වර පෙන්වා දෙන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

(අ ) ගිණුම්කරණය

(ආ) සේවක මණ්ඩල කටයුතු

(ඇ) වාහන පාලනය

(ඈ) වත්කම් පාලනය

(ඉ) ප්‍රසම්පාදන කටයුතු